සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

27484

## 8 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය:- ................................................................................. කාලය: පැය 2යි.

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
- පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01) බුදුරජාණන් වහන්සේ විසින් ඇතැම් සත්ත්වයන් මරණින් පසුව අපාගත වීමට ද දුගතියට පත්වීමට ද හේතුව ලෙසට දේශනා කළේ,

1. අධම්ම චරියාව ය. 2. ධර්ම චරියාව ය. 3. සම චරියාව ය. 4. කුසල චරියාව ය.

(02) "ඉච්ඡිත අලාභ දුක්ඛය" පිළිබඳව සඳහන් වන්නේ, කවර සත්‍යය තුළ ද?

1. සමුදය ආර්ය සත්‍ය ය. 3. දුක්ඛ ආර්ය සත්‍ය ය.
2. නිරෝධ ආර්ය සත්‍ය ය. 4. මාර්ග ආර්ය සත්‍ය ය.

(03) කනට ඇහෙන ශබ්ද නිසා දනෙන මිහිර නැවතත් ලැබීමට ඇති ආශාව,

1. පොට්ඨබ්බ තණ්හාව. 2. ගන්ධ තණ්හාව. 3. සද්ද තණ්හාව. 4. රස තණ්හාව.

(04) "පුතණුවනි, මේ මාගේ තුන්වන වැඳීම යැ"යි පවසමින් සුද්ධෝදන රජතුමා සිරිපා වැන්දේය. මෙය සිදු වූයේ,

1. සිදුහත් කුමරු ශිල්ප දැක්වීමෙන් පසු ය. 3. නම් තබන දිනයේ ය.
2. බුදුරදුන් කිඹුල්වත් පුරයට වැඩි අවස්ථාවේ ය. 4. වප් මඟුල් දිනයේ ය.

(05) "ඔබ දීර්ඝව කළ ධර්ම කතාව භික්ෂූන් වහන්සේට බොහොම ප්‍රයෝජනවත්. ඒත් පිටතට වී සිටි මගේ නම් කොන්ද රිදෙනවා" බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළේ,

1. සැරියුත් හිමියන්ට 2. නන්දක හිමියන්ට 3. ආනන්ද හිමියන්ට 4. රාහුල හිමියන්ට

(06) නිවනට පමුණුවන මනා වූ සුන්දර ප්‍රතිපත්තියේ පිහිටි යන අදහස නිසා මහ සඟ රුවන,

1. උජුපටිපන්න ය. 2. පාහුණෙය්‍ය ය. 3. සාමීචිපටිපන්න ය. 4. සුපටිපන්න ය.

(07) ආනන්ද හිමියන්ට නොතිබුන තනතුර කුමක් ද?

1. සද්ධිමතුන් අතරින් අග්‍රවීම. 3. ධෛර්ය සම්පන්න වූවන් අතරින් අග්‍රවීම.
2. බහුශ්‍රැතයන් අතරින් අග්‍රවීම. 4. සිහි කල්පනාව ඇත්තවුන් අතරින් අග්‍රවීම.

(08) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වන පරිදි කල්‍යාණ මිත්‍රයෙකු නොවන්නේ මින් කවර පුද්ගලයෙක් ද?

1. සමාන සුඛ දුක්ඛ. 2. අනුකම්පක. 3. උපකාරක. 4. අඤ්ඤදත්ථුහර.

(09) දෙවන ධර්ම සංගායනාවට ප්‍රධානත්වය දැරූ මහරහතන් වහන්සේ වනුයේ,

1. සබ්බකාමී මහරහතන් වහන්සේ.
2. යස මහරහතන් වහන්සේ.
3. කාශ්‍යප මහරහතන් වහන්සේ.
4. රේවත මහරහතන් වහන්සේ.

(10) ලංකාවට දළදා වහන්සේ වැඩම කරවන විට මෙහි රජකම් කළ රජතුමා වන්නේ,

1. කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමා.
2. දේවානම්පියතිස්ස රජතුමා.
3. දුටු ගැමුණු රජතුමා.
4. වළගම්බා රජතුමා.

(11) ඔබේ ගමේ සිටින වයසින් වැඩිහිටි කිහිප දෙනෙකු පාසලට කැඳවා ඔවුන්ට සත්කාර දක්වීම මගින් පැහැදිලි වන්නේ,

1. කළගුණ සැලකීමේ ගුණය යි.
2. වැඩිහිටියන්ට සැලකීමේ ගුණය යි.
3. රට ගැන සිතීම යි.
4. සංවිධානාත්මක ව ක්‍රියා කිරීම යි.

(12) බෞද්ධ නිවසක කෙනෙකු මිය ගිය පසු ව ස්වාමීන් වහන්සේලා වැඩම කරවාගෙන ආගමික වතාවත් සිදු කරයි. මෙම අවස්ථාවේ දී සිදු කරනු ලබන වැදගත්ම ආගමික චාරිත්‍රය වන්නේ,

1. මතක වස්ත්‍ර දහැත් ගිලන්පස පූජා කර පැන් වැඩීම ය.
2. ගුණ කථනයක් ඉදිරිපත් කිරීම ය.
3. තම ඥාතීන් සමඟ දුක බෙදා ගැනීම ය.
4. අවසන් ගෞරව දක්වීමට අවස්ථාව ලබාදීම ය.

(13) පාසල අවසන් වීමට පෙර ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් "යො වදතංපවරෝ මනුජේසු" යන ගාථාවන් ගායනා කරන ලදී. මෙම ගාථා හඳුන්වන නම වනුයේ,

1. දහම් ගුණ පිළිබඳව දක්වෙන ගාථාවන් ය.
2. ජත්තමානවක ගාථාවන් ය.
3. බුදු ගුණ දක්වෙන ගාථාවන් ය.
4. සඟ ගුණ දක්වෙන ගාථාවන් ය.

(14) "මහණෙනි ඔබ ගිලනුන්ට උපස්ථාන කරන්නේ නම් ඔහු මට උපස්ථාන කිරීම හා සමානය" මින් හෙළි වන්නේ,

1. ගිලනුන්ට උපස්ථාන කිරීම අනිවාර්ය බව ය.
2. ගිලනුන්ට බේත් ලබා දීම ය.
3. ගිලනුන්ට උපස්ථාන කිරීමේ වටිනාකම ය.
4. ගිලන් බවින් මුදාගත යුතු බව ය.

(15) බෝසතාණන් වහන්සේගේ බුද්ධිමත්භාවයත්, නොපසුබස්නා වීර්යයත් පිළිබඳව සඳහන් වන ජාතක කතාව,

1. වෙස්සන්තර ජාතකය. 2. වණ්ණුපථ ජාතකය. 3. ක්ෂාන්තිවාදී ජාතකය. 4. සම්බුලා ජාතකය.

- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(16) සතුන් මැරීමෙන් වැළැකීම මංගල කරුණකි. ( )

(17) බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ දෙවියන්ට ය. ( )

(18) මහනුවර දළදා මාළිගාවේ වැඩ සිටින්නේ බුදුරජාණන් වහන්සේගේ වම් දළදා වහන්සේ ය. ( )

(19) දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වූයේ විශාලා මහනුවර වාලුකාරාමයේ දී ය. ( )

(20) ආහාර ගන්නා විට බත් පිඩු මුඛය සමීපයට ගෙන ඒමට පෙර මුඛය විවෘත කළ යුතු ය. ( )

## II කොටස

- පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. ජෙතවන පාසල් වාරයෙහි බුද්ධ ධර්මය විෂයට අදාළව නායකත්ව ලක්ෂණ උපයෝගී කරගෙන යහපත් ආර්ථිකයක් ගොඩ නැංවීමේ කරුණු තහවුරු කරන දසරාජ ධර්ම පිළිබඳ "සංවාදශීලී ළමා පාර්ලිමේන්තුව" යන ඇගයීම කරන ලදී. ඊට අදාළව පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මේ සඳහා ඔබ හට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඔබගේ පන්තිය මේ සඳහා සූදානම් වූ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 02)

(iii) දසරාජ ධර්ම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) එම නම් කරන ලද දසරාජ ධර්ම දෙක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(v) ශ්‍රී ලංකාවේ ධාර්මික ව රාජ්‍ය පාලනය කළ රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(vi) කාන්තාරයේ ජලය නොමැති ව අතරමං වී සිටින විට ජලය සොයාගත් වෙළෙඳ නායකයා සිටි ජාතක කතාවේ නම කුමක් ද? (ලකුණු 02)

(vii) එම වෙළෙඳ නායකයා තුළ පැවති නායකත්ව ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(viii) පාසලේ ශිෂ්‍ය නායකයෙකු තුළ තිබිය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(x) "සංවාදශීලී ළමා පාර්ලිමේන්තුව" තුළින් ඔබට ඇති වූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ix) ළමා පාර්ලිමේන්තුව තුළින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

02. (i) දස අකුසල වස්තු තුළ ඇති කරුණු දෙකක් ලියා එහි තේරුම ලියන්න. (ලකුණු 02)

(ii) දෙවැනි ධර්ම සංගායනාව සඳහා සහභාගී වූ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා තුන් නමක් නම් කරන්න. (ලකුණු 03)

(iii) දෙවැනි ධර්ම සංගායනාව පැවැත් වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) දළදා වහන්සේ ලක් දිවට වැඩම කරවන ලද දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ දී දළදා වහන්සේගේ භාරකාරත්වය දැරූ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(iii) දළදා වහන්සේ අපේ ජාතික හා පූජනීය වස්තුවක් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) සිගාලෝවාද සූත්‍රයට අනුව මිත්‍ර ප්‍රතිරූපකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) අත්ථක්ඛායී මිත්‍රයා තුළ ඇති ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) බාලයන් ඇසුරු කිරීමෙන් වැළැකී කලණ මිතුරන් ඇසුරු කිරීම තුළින් දියුණුව සැලසෙන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) සේඛියා ධර්ම යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද? (ලකුණු 02)

(ii) ආහාර ගන්නා අවස්ථාව හා සම්බන්ධ වන **නොකළ** යුතු දේවල් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ආහාර ගැනීමේ යහ පුරුදු සේඛියා ධර්මවල සඳහන් වේ. ඉන් පහක් ඇසුරු කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) සඟ ගුණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ආර්ය පුද්ගලයන් අට දෙනාගෙන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබේ ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේගෙන් මිනිසුන්ට සිදු වන සේවාවන් පහක් ලියන්න. (ලකුණු 05)

07. (i) චතුරාර්ය සත්‍යයෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) තණ්හාව බෙදෙන ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) එම කරුණුවලින් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ස ......... ඝ